ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ/ප්‍රවෘත්ති සංස්කාරක

**2020 දෙසැම්බර් 21**

# ප්‍රවෘත්ති නිවේදනය

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 නොවැම්බර්**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 නොවැම්බර් මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 5.2%ක් බව එහි වැඩබලන අධ්‍යක්‍ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය ඔක්තෝම්බර් මාසයේ මතුපිට උද්ධමනය 5.5%ක් ලෙස වාර්තා විය. 2020 නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.0%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2019 නොවැම්බර් මාසයේ 4.1% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 1.8%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.3%ක් විය. 2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 නොවැම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල්, කහ කුඩු, පොල්තෙල්. සහල්, සීනි සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2020 ඔක්තෝම්බර් මාසයේ 139.1ක් වූ දර්ශකාංකය 2020 නොවැම්බර් මාසයේ 139.8ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 නොවැම්බර් මාසයේ දර්ශකාංකය 0.7ක වැඩිවීමක් එනම් 0.5ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.34%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.13%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, ලොකු ළූණු, පොල්, අර්තාපල්, රතු ළූණු, මයිසූර් පරිප්පු, දෙහි, එළවළු, පොල්තෙල්, සියඹලා, කරවල, මිරිස් කුඩු, සුදුළූණු, වියළි මිරිස්, කහ කුඩු, මුං ඇට, කොස් මදුළු සහ තුනපහ කුඩු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් අළුත් මාළු, පළතුරු, සීනි, බිත්තර සහ කුකුළ් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'ප්‍රවාහන' (*බස් ගාස්තු*) කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට ‘රෙදිපිළි හා පාවහන්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එහෙත් ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*බුලත්, පුවක්*) සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවල මිල අඩුවීමක් වාර්තා වී ඇත. පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', ‘අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්‍ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 ඔක්තෝම්බර් මාසය සඳහා වාර්තා වූ පරිදිම 2020 නොවැම්බර් මාසයේ 4.5% ලෙස වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2019 | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| 2020 | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජුනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |
| | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |
| | නොවැ. | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 |